සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 33 S I

## ඉතිහාසය I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**

* සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
* අංක 01 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්න වල (1), (2), (3), (4) යන පිළිතුරු වලින් වඩාත්ම නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුල (X) යොදන්න.

(01) බුදුන් වහන්සේගේ ලංකා ගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු ඇතුළත් පැරණි සාහිත්‍ය මූලාශ්‍රයකට උදාහරණයක් වන්නේ,
1. චූල වංශයයි. 2. පූජාවලියයි. 3. මහාවංශයයි. 4. දීප වංශයයි.

(02) අභිලේඛණ මූලාශ්‍රයට උදාහරණයකි.
1. ටොලමිගේ ලෝක සිතියම. 2. දාඨා වංශය.
3. වල්ලිපුරම් රන්පත. 4. සීගිරි චිත්‍ර.

(03) නානක මූලාශ්‍රයකට උදාහරණයක් නොවන්නේ,
1. ඇතා හා ස්වස්ථික ලකුණ දරණ ධජය ය. 2. ඇතා හා ස්වස්ථික ලකුණ දරණ කාසිය ය.
2. තඹ මස්ස ය. 4. "අක" නම් රන් කාසිය ය.

(04) මෙරට ඉතිහාසය පිළිබඳ ලියවුන විදේශ ග්‍රන්ථ කිහිපයක් "A" තීරුවේ ද ඒවා රචනා කළ කතුවරුන් "B" තීරුවේ ද දක්වා ඇත. A හා B තීර නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. ලංකා පුරාවෘත්තය. | A. රොබට් නොක්ස්. |
| 2. එදා හෙළදිව | B. මෙගස්තිනිස්. |
| 3. ඩිමුන්ඩෝ | C. බැල්දියෙස්. |
| 4. ඉන්ඩිකා | D. ටොලමි. |
| 5. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය. | E. ඇරිස්ටෝටල්. |

1. DECBA ය. 2. BDCEA ය. 3. ADBCE ය. 4. CAEBD ය.

(05) පහත "A" තීරුවෙන් අභිලේඛන වර්ග කීපයක්ද, "B" තීරුවෙන් එම අභිලේඛන සඳහා නිදසුන් කීපයක්ද, දැක්වේ. A හා B තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. ලෙන්ලිපි | P. ගල්පොත ශිලා ලිපිය. |
| 2. ගිරිලිපි | Q. වේගිරිය ලිපිය. |
| 3. ටැම්ලිපි | R. බදුලුටැම් ලිපිය. |
| 4. පුවරු ලිපි | S. ගඩලාදෙණිය සෙල්ලිපිය. |

1. QRSP ය. 2. QSRP ය. 3. PRSQ ය. 4. PSQR ය.

(06) ශ්‍රී ලංකාවේ මානව ජනාවාස පිළිබඳ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන මුල්ම ස්ථානය වන්නේ,
1. ඉරණමඩු සැකැස්මෙනි. 2. රත්නපුර ආශ්‍රිත මැණික් පතල් වලිනි.
2. පාහියන්ගල ලෙනෙනි. 4. කුරුවිට බටදොඹ ලෙනෙනි.

(07) පූර්ව ඓතිහාසික යුගයට අයත් මැටි ඔරු සුසාන හමු වූ ස්ථානයක් වන්නේ,
1. ඉබ්බන් කටුවය. 2. යටහලෙනය.
3. උඩරංචාමඩමය. 4. පොම්පරිප්පුවය.

(08) ගමික සතු කාර්යයන් අතරට අයත් නොවන කාර්යය වන්නේ,
1. අපරාධකරුවන් ගමට ආ විට අල්ලා දීමය. 2. ගම්වල පොදු කටයුතු සඳහා සහය දීම ය.
3. ගමේ බදු මුදල් එකතු කිරීම ය. 4. රාජ අපරාධකරුවන් සඳහා දඬුවම් දීම ය.


(09) පහත දැක්වෙන වෘත්තිකයන් විසූ ගම්මාන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
A. මැණික් කපන්නන්. B. ධීවරයන් විසූගම්.
C. ගොපල්ලන් විසූ ගම්. D. වඩුවන් විසූ ගම්.

1. කේවට්ටගාම, ගෝපාලගාම, වඩ්ඩකීගාම, මණිකාරගාම.
2. මණිකාරගාම, වඩ්ඩකිගාම, ගෝපාලගාම, කේවට්ටගාම.
3. මණිකාරගාම, කේවට්ටගාම, ගෝපාලගාම, වඩ්ඩකිගාම.
4. මණිකාරගාම, ගෝපාලගාම, කේවට්ටගාම, වඩ්ඩකිගාම.

(10) ඉරහඳ, වටාපත, ඇත් අඩිය, ගොන්කුරය ආදී සළකුණු වලින් පෙන්නුම් කරන්නේ,
1. චිත්‍ර කලාව පිළිබඳය. 2. සන්නිවේදන ක්‍රම පිළිබඳය.
3. ප්‍රාදේශීය විෂමතා පිළිබඳවය. 4. සංස්කෘතිය හා සමාජය පිළිබඳවය.

(11) ක්‍රි. පූ. 250 තරම් පැරණි බ්‍රාහ්මීය සෙල්ලිපියක "පුරකමත" ලෙසින් තනතුරු නාමයක් සඳහන්ව තිබේ. එයින් අදහස් වන්නේ,
1. නගරයේ ප්‍රධාන වාස්තු විද්‍යාඥයාය. 2. නගරයේ ප්‍රධාන වඩුකාර්මිකයාය.
3. ගමේ ප්‍රධාන "කමත" භාරව සිටින්නාය. 4. ගමේ ප්‍රධාන වෙළඳ ශ්‍රේණි භාරකරුය.

*** අංක 12 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ලංකා සිතියම ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




(12) සංඝමිත්තා තෙරණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝධි ශාඛාව මෙරටට වැඩම කර වූ වරාය දැක්වෙන අක්ෂරය වන්නේ,
1. M ය. 2. N ය.
3. O ය. 4. P ය.

(13) දෙවන නාගරීකරණය හමුවේ වෙළඳාම සම්බන්ධයෙන් අනුරාධපුරයට පසුව බිහි වූ අනෙක් වැදගත් වෙළඳ නගරය,
1. M ය. 2. N ය.
3. O ය. 4. P ය.

(14) භද්දකච්චායනා ඇතුළු ආර්ය සංක්‍රමණික කණ්ඩායම මෙරටට ගොඩබසින ලද වරාය දැක්වෙන අක්ෂරය වන්නේ,
1. M ය. 2. N ය.
3. T ය. 4. P ය.

(15) හේමමාලා සහ දන්ත කුමරු දන්ත ධාතුන් වහන්සේ මෙරටට වැඩම කරන ලද වරාය දැක්වෙන අක්ෂරය වන්නේ,
1. M ය. 2. N ය.
3. T ය. 4. P ය.

(16) අතීතයේ පටන් අසල්වාසී රටවල් සමග යහපත් සංස්කෘතික සහයෝගයක් පැවති බවට හොඳම සාක්ෂියක් පෙන්වා දෙමින් ඉන්දියාවේ පත්තිනි දේවාලයක් ඉදිකිරීම සඳහා ගිය ලම්භකරණ වංශයට අයත් රජතුමා වන්නේ,
1. වසභ රජුය. 2. I වන ගජබා රජුය. 3. I වන විජයබා රජුය. 4. II වන ගජබා රජුය.

(17) අරාබි ජාතික ඉතිහාසඥ අල් - බල් සූරි සඳහන් කරන අන්දමට ඔහු ලංකාව හඳුන්වා ඇත්තේ,
1. සෙරන්ඩිබ් නමිනි. 2. තැපෝබ්‍රේන් නමිනි. 3. රතුකැට දිවයින නමිනි. 4. සීලැන් නමිනි.

*** අංක 18 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වගුව අධ්‍යයනය කොට පිළිතුරු සපයන්න.**

| රජතුමා | සෙල්ලිපිය | සඳහන් තොරතුරු |
|---|---|---|
| A. I ගජබා | E. වේවැල්කැටිය සෙල්ලිපිය | • දඩ මුදල් නිසියාකාරව දියයුතු බව. |
| B. IV උදය | F. කොන්ඩවට්ටවාන් ටැම්ලිපිය | • වෙළඳපළ නීති පිළිපැදීම. |
| C. V වන කාශ්‍යප | G. සිතුල්පව්ව සෙල්ලිපිය | • රජයේ නීතිරීති මත ගස්කොලන් කළමණාකරණය කළයුතු බව. |
| D. IV වන මිහිඳු | H. හෝපිටිගමු ටැම්ලිපිය | • අපරාධ නීති පිළිබඳව. |

(18) "අපරාධ නීතිය පිළිබඳව" තොරතුරු ලබාගත හැකි සෙල්ලිපිය හා එය කරවූ රජතුමා පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. A හා F ය. 2. D හා E ය. 3. B හා H ය. 4. A හා G ය.

(19) I වන ගජබා රජු විසින් කරවන ලද සෙල්ලිපිය හා තොරතුරු හැඳින්වන්නේ,
1. F හා K ය. 2. E හා L ය. 3. G හා I ය. 4. H හා J ය.

(20) කොන්ඩවට්ටවාන් ටැම් ලිපිය කරවූ රජතුමා හා එහි සඳහන් තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
1. D හා L ය. 2. C හා K ය. 3. B හා J ය. 4. A හා I ය.

(21) පහත දැක්වෙන රාජ්‍ය පාලක පාලිකාවන් අතරින් අනුරාධපුර යුගයට පමණක් අයත් පිරිස ඇතුළත් පිළිතුර තෝරන්න.

A. වසභ D. මහසෙන්
B. ධාතුසේන E. I පරාක්‍රමබාහු
C. I විජයබාහු F. වලගම්බා

1. A, C, B හා E ය. 2. A, B, C හා E ය. 3. E, P, B හා C ය. 4. A, B, D හා F ය.

(22) පෙතංගොඩ උයනේදී උණ කටුවක් ඇනී විෂවීමෙන් මරණයට පත් වූ රජතුමා කවුරුන්ද?
1. VII වන බුවනෙක බාහුරජුය. 2. VIII වන පරාක්‍රමබාහු රජුය.
3. II වන රාජසිංහරජුය. 4. I වන රාජසිංහ රජුය.

(23) යකඩ නිස්සාරණය වන උෂ්ණත්වය වන්නේ,
1. $1548^0C$ දීය. 2. $1358^0C$ දීය. 3. $1538^0C$ දීය. 4. $1853^0C$ දීය.

(24) දැදිගම ඇත් පහනේ ඇති විද්‍යාත්මක මූලධර්මය වන්නේ,
1. වජ්‍ර චුම්භට න්‍යායයි. 2. අචල ජල විද්‍යාත්මක න්‍යායයි.
3. ලම්භක න්‍යායයි. 4. චුම්භක න්‍යායයි.

(25) "නිශ්ශංක මල්ල රජතුමා විසින් ප්‍රධාන මං මාවත් වල ගව්වෙන් ගව්වට ගල්කණු පිහිටුවීමට නියෝග කළ රජෙකි." අතීතයේ ගව්වක දුර වර්තමානයේ සමාන වන්නේ,
1. සැතපුම් 1 කටය. 2. මීටර් 1 කටය.
3. කිලෝමීටර 1 කටය. 4. සැතපුම් 2කටය.

(26) පහත "අ" හා "ආ" තීර වල ඇති තොරතුරු ගලපා නිවැරදි පිළතුර තෝරා ලියන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1, දකපති | A. මාළු ඇල්ලීම සඳහා ගෙවූ බදු. |
| 2. බොජකපති | B. වැව්වල ජලය භාවිත කිරීම වෙනුවෙන් ගෙවූ බදු. |
| 3. මකරමජිබක | C. රජුට අයත් ඉඩම් වගා කිරීම වෙනුවෙන් ගෙවූ බදු |

1. B, C හා A ය. 2. A, B හා C ය. 3. C, B හා A ය. 4. B, A හා C ය.

(27)
- ⋆ දඹදෙණි යුගයේ රජකළ පාලකයෙකි.
- ⋆ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නාමයෙන් පිදුම් ලැබීම.
- ⋆ විදේශ ආක්‍රමණ තුනකට මුහුණු දී ජය ලැබීම.

ඉහත සඳහන් තොරතුරු හා සම්බන්ධ රජතුමා කවුද?

1. I වන බුවනෙකබාහු රජුය. 2. II වන විජයබාහු රජුය.
3. II වන පරාක්‍රමබාහු රජුය. 4.. IV වන බුවනෙකබාහු රජුය.

(28) පරිසරය ආරක්ෂා කිරීම සඳහා නිතී පැනවූ රජතුමා වන්නේ,
1. III වන උදය රජුය. 2. II වන පරාක්‍රමබාහු රජුය.
3. I වන දප්පුල රජුය. 4. III මහින්ද රජුය.

(29) "දියකැට පහන" නම් වූ ජල කළමණාකරණ උපාංගය අයත් වන්නේ, පහත කවර ජල කළමණාකරණ අංශයටද?
1. ඌරාකැට ළිඳටය. 2. සීගිරි ජලමල් තාක්ෂණයටය.
3. සොරොව්වටය. 4. වාරි ඇළටය.

(30) පහත සඳහන් තොරතුරු අධ්‍යයනය කර ගම්පල යුගයට පමණක් අයත් සාහිත්‍ය ග්‍රන්ථ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මයුර සංදේශය, තිසර සංදේශය, සද්ධර්මාලංකාරය, පාරමී ශතකය.
2. මයුර සංදේශය, බුදුගුණ අලංකාරය, සද්ධර්මාලංකාරය, පාරමී ශතකය.
3. ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍ය, බුදුගුණ අලංකාරය, මයුර සංදේශය.
4. පරවි සංදේශය, ගිරා සංදේශය, සැළලිහිණි සංදේශය, මයුර සංදේශය.

*** පහත A, B, C හා D යන යුගල අධ්‍යයනය කර 31, 32, 33 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - 1. කොන්ස්තන්තිනෝපලය තුර්කීන් යටත් කර ගැනීම.
2. පුනරුදය ඇතිවීම

B - 1. දේවවරම් වාදය
2. මානව වාදය.

C - 1. දේශ ගවේෂණය ඇතිවීම.
2. අධිරාජ්‍ය වාදය බිහිවීම.

D - 1. ජොහැන්ස් ගුටෙන් බර්ග්.
2. හෙන්රි ස්ටීල් ඕල්කට්.

(31) ඉහත සඳහන් තොරතුරු ඇසුරින් කිසිම සම්බන්ධයක් නොදක්වන අදහස් යුගලය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

(32) පලමුවැන්නේ බිඳවැටීම, දෙවැන්න ඇතිවීමට හේතු විය.
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

(33) පලමු වැන්නේ ව්‍යාප්තිය මත දෙවැන්න බිහිවීම සිදුවිය.
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

(34) "සුහපැත්මේ තුඩුව" හෙවත් කුණාටු තුඩුව සොයාගත් පෘතුගීසි ජාතික දේශගවේශකයා කවුද?
1. වස්කෝද ගාමාය. 2. ක්‍රිස්ටෝපර් කොළොම්බස්ය.
3. බර්තෝලමියු ඩයස්ය. 4. නාවික හෙන්රිය.

(35) පෘතුගීසි ජාතිකයන් කොන්ස්තන්තිනෝපාලය යටත් කරගත් වර්ෂය වන්නේ,
1. ක්‍රි.ව. 1453 දීය. 2. ක්‍රි.ව1543 දීය. 3. ක්‍රි.ව. 1354 දීය. 4. ක්‍රි.ව 1435 දීය.

(36) පුනරුද සමයේදී නව චිත්‍ර කළාවක් බිහිකළ ප්‍රධාන නගරය හා රට වන්නේ,
1. ග්‍රීසියේ ඇතැන්ස්ය. 2. ඉතාලියේ ෆෝලෝරන්ස්ය.
3. ස්විස්ටර්ලන්තයේ ජිනිවාය. 4. ප්‍රංශයේ පැරීසියය.

(37) රුධිරය ශරීරයේ දකුණු කෝෂයෙන් පිටවී ගොස් පෙනහැලි මගින් පිරිසිදු වී ශරීරය පුරා විසිරී යන බව ලොවට හෙළිකළ විද්‍යාඥයා,
1. ස්වීස් ජාතික වෛද්‍ය පැරසල්සස්ය. 2. ඉංග්‍රීසි ජාතික විලියම් හාර්වේය.
3. ස්වීස් ජාතික මයිකල් සර්ටෙස්ය. 4. ජර්මන් ජාතික මාටින් ලූතර්ය.

*** පහත M සිට Q දක්වා දී ඇති තොරතුරු අධ්‍යයනය කොට අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

M - නිශ්ශංක අලකේෂ්වර ඇමතියා විසින් කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් ඉදි කිරීම.
N - උඩරට සාමන්ත පාලකයා වූ ජෝතිය සිටානන් ඇතිකළ කැරැල්ල මැඩලීම.
O - ඉබන් බතුතා නම් අාබි ජාතික සංචාරකයා ලංකාවට පැමිණීම.
P - විජය සුන්දරාරාමය කරවීම.
Q - තෙවන විජයබාහු රජකිරීම.

(38) ඉහත තොරතුරු ඇසුරින් ගම්පල යුගයේදී සිටි පුද්ගලයෙකුට අසන්නට ලැබෙන තොරතුරු ඇතුලත් කාණ්ඩය කුමක්ද?
1. M හා N ය. 2. O හා P ය. 3. Q හා N ය. 4. M හා O ය.

(39) දඹදෙණි යුගයට පමණක් අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. O හා Q ය. 2. P හා Q ය. 3. Q හා N ය. 4. M හා N ය.

(40) පාලි භාෂාවෙන් පැවති පන්සිය පනස් ජාතක පොත සිංහල භාෂාවට පරිවර්තනය කළේ කුමන යුගයේ?
1. දඹදෙණි යුගයේ ය. 2. කෝට්ටේ යුගයේ ය.
3. කුරුණෑගල යුගයේ ය. 4. ගම්පල යුගයේ ය.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 33 | S | II |
|---|---|---|---|---|

## ඉතිහාසය II

කාලය පැය 03 යි

**සැලකිය යුතුයි.**

* I වන කොටසේ (1) ප්‍රශ්නය අන්වාර්යය වේ.
* II කොටසින් ප්‍රශ්න හතරකටද III කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි.

### 1 කොටස

(01) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

I. i. ඉරණමඩු, පිදුරංගල, ත්‍රිකුණාමලය, ගල් සොහොන් කනත්ත, මාගම, වලවේ ගඟ, පරාක්‍රම සමුද්‍රය, කෝට්ටේ, සෙංකඩගල, මන්නාරම, කලාඔය, කාජරගාම. (ලකුණු 12යි)

ii. ජපානය, සුමාත්‍රා දූපත, පෝක් සමුද්‍ර සන්ධිය, රතු මුහුද, කැලිකට්, ඉතාලිය. (ලකුණු 06යි)

පහත A, B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම්, පිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.


A - ඓතිහාසික මූලාශ්‍ර අනුව මෙරට පාලනය කළ ප්‍රථම රජතුමා -
B - විදේශ මූලාශ්‍රයක් වන "නැවුරාලිස් හිස්ටෝරියා" කෘතිය ලියූ පුද්ගලයා -
C - "ක්‍රිස්තියානීන් සහ කුළු බඩු සොයා අපි මෙහි පැමිණියෙමු." යන ප්‍රකාශය කළ පුද්ගලයා -
D - ලංකාව පාලනය කළ අවසාන සිංහල රජතුමා - (ලකුණු 04යි)

II. පහත A, හා B යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



1. මෙම රූපයෙන් දැක්වෙන රජතුමා කවුද?
2. මෙතුමා කුමන යුගයට අයත් පාලකයෙක්ද?
3. මෙතුමා විසින් පෘතුගීසින් අන්ත පරාජයකට පත්කළ සටන කුමක්ද?
4. මෙතුමාගේ මෙම සිතුවම අඳින ලද පුද්ගලයා කවුද?

III.



1. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. මෙමගින් සිදුකළ ප්‍රධාන කාර්යය කුමක්ද?
3. මෙම තාක්ෂණය භාවිතා කළ බවට තොරතුරු ලැබී ඇති ප්‍රදේශය කුමක්ද?
4. මෙහි දැකිය හැකි එක් විද්‍යාත්මක තාක්ෂණික ශිල්පීය ක්‍රමයක් ලියන්න.

(ලකුණු 04යි)

## II කොටස

(02) I. පහත a, b හා c යටතේ අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

a - ලංකාවේ පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය -

b - මෙරට ශාසන ඉතිහාසය පිළබඳව ලියා ඇති මූලාශ්‍රය -

b - ලංකාව පිළිබඳව අඛණ්ඩ ඉතිහාසයක් ලියවී ඇති මූලශ්‍රය -

(දීප වංශය, බෝධි වංශය, ධාතු වංශය, මහාවංශය, රාජාවලිය, නිකාය සංග්‍රහය, පූජාවලිය.)

(ලකුණු 03යි)

II. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04යි)

III. a - නානක මූලාශ්‍රයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 01යි)

b - "නානක මූලාශ්‍ර" රටක ඉතිහාස ඉගෙනීමේදී ප්‍රයෝජනවත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 04යි)

IV. පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබ පුරාවස්තු රැක ගැනීම සඳහා කටයුතු කරන ආකාරය පිළිබඳව කරුණු තුනක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(03) I. ප්‍රාග් ඓතිහාසික මානවයා විසුවායැයි සැලකෙන ලෙන් වාසස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03යි)

II. a - ප්‍රාග් ඓතිහාසික මානවයා ජනාවාස පිහිටුවා ගැනීමේදී සලකා බැලූ සාධක දෙකක් ලියන්න.

b - ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිතා කළ ශාක ආහාර දෙකක් සහ සත්ව ආහාර දෙකක් නම් කරන්න.

(ලකුණු 04යි)

III. පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්ෂණය භාවිතා කළ බවට ලැබී ඇති සාක්ෂි දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. මුල් ඓතිහාසික ජනාවාස වල දක්නට ලැබුණු මූලික ලක්ෂණ හතරක් ලියා ඉන් එකක් පහදන්න.

(ලකුණු 06යි)

(04) I. "රාජ්‍යත්ව සංකල්පය" යටතේ පහත අන්වර්ථ/ ගෞරව නාමයන්ගෙන් පිදුම් ලත් රජවරුන්ගේ නම් වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න.

1. "අකලපය මහරජ" -
2. "නර ඉසෙර". -
3. "චක්‍රවර්ති" -

(මහසෙන්, කුටකණ්ණාභය, වසභ, කාශ්‍යප, නිශ්ශංකමල්ල, ධාතුසේන) (ලකුණු 03යි)

II. මධ්‍ය පාලනය හා සම්බන්ධ පහත සඳහන් තනතුරු නාම දැරූ පුද්ගලයන්ගේ නිල නාමයන් මොනවාදැයි ඉදිරියෙන් ලියන්න.

1. නගරගුත්තික -
2. බඩගරික -
3. හති අදෙක -
4. රූප අදෙක - (ලකුණු 04යි)

III. අතීතයේ රාජ්‍ය උරුමය සිදු වූ ආකාරය උදාහරණ දෙකක් සහිතව පහදන්න. (ලකුණු 05යි)

IV. වාරි කර්මාන්තයට අමිල සේවයක් ඉටුකළ වසභ රජුගේ දේශපාලන හා ආර්ථික වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(05) I. පහත සඳහන් වැව් ඉදිකරන ලද රජවරුන් කවුරුන්දැයි ඉදිරියෙන් ලියන්න.

A - ගිරිතලේ වැව -

B - කළා වැව -

C - තිසා වැව - (ලකුණු 03යි)

II. රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04යි)

III. "අපේ අතීත මුතුන් මිත්තන් හා රංවරුන් පරිසරයට ආදරය කළ පරිසරය ආරක්ෂා කළ පිරිසක් වූ බව සත්‍යයකි." ඔවුන් පරිසරය ආරාක්ෂා කළ ආකාරය උදාහරණ දෙකක් මගින් පහදන්න. (ලකුණු 05යි)


IV. පහත රූපය අධ්‍යානය කොට එහි A, B, C හා D වලින් දක්වා ඇති වාරි තාක්ෂණික අංග නම් කර ඉන් ඔබ කැමති තාක්ෂණික අංග දෙකක් මගින් සිදුකරනු ලබන කාර්යය කෙටියෙන් පහදන්න.

A -

B -

C -

D -




(ලකුණු 06යි)

(06) I. පහත තනතුරු නාම දැරූ පුද්ගලයන්ගේ නිළ නාමයන් ඉදිරියෙන් ලියන්න..
a - නිවසේ ප්‍රධානියා -
b - ගමේ ප්‍රධානියා -
c - ප්‍රදේශයේ ප්‍රධානියා - (ලකුණු 03යි)

II. අතීතයේ සිටි රජවරු මහජනතාව වෙනුවෙන් ඉටුකළ යුතුකම් හතරක් දක්වන්න. (ලකුණු 04යි)

III. පැරණි ශ්‍රී ලංකාවේ කෘෂි අංශය යටතේ පැවති ප්‍රධාන ගොවිතැන් ක්‍රම දෙකක් දක්වා ඒ පිළිබඳව සරලව පහදන්න. (ලකුණු 05යි)

IV. පැරණි ලංකාවේ රජවරු වෙළඳාම සම්බන්ධයෙන් දැඩි අවධානයෙන් සිටි බව උදාහරණ තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06යි)

(07) I. පෘතුගීසින් මෙරටට පැමිණෙන විට ලංකාව බෙදී පැවති ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03යි)

II. පහත සඳහන් සටන් මෙහෙය වූ පෘතුගීසි සෙන්පතිවරුන්ගේ නම් වරහන් තුළින් තෝරා ලියන්න.
1. ක්‍රි.ව. 1594 - දන්තුරේ සටන -
2. ක්‍රි.ව. 1602 - බලන සටන -
3. ක්‍රි.ව. 1630 - රන්දෙණිවෙල සටන -
4. ක්‍රි.ව. 1638 - ගන්නෝරුව සටන - (ලකුණු 04යි)

(දොන් ජොරනිමෝද අසවේදු / කොන්ස්තන්තීනූද සා/ පේරෝ ලෝපෙස් ද සූසා / දියේගෝ ද මෙලෝ / ක්වේරෝස්)

III. I වන විමලධර්ම සූරිය රජුගේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 05යි)

IV. උඩරට රාජ්‍යයේ සමාජ හා ආර්ථික ලක්ෂණ තුන බැගින් ලියන්න. (ලකුණු 06යි)

## III කොටස

(08) I. පහත සඳහන් යුරෝපා ජාතීන්ගේ පෙරදිග පිහිටුවා තිබූ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථාන ඉදිරියෙන් ලියන්න.
1. පෘතුගීසින් -
2. ලන්දේසීන් -
3. ඉංග්‍රීසින් - (ලකුණු 03යි)

II. යුරෝපා ජාතීන් ලංකාවට පැමිණීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 04යි)

III. "යුරෝපා ජාතීන්ට ආසියාවට පැමිණීමට දේශගවේෂණය හා විද්‍යා ප්‍රබෝධය බොහෝ දුරට හේතු සාධක විය." උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. යුරෝපා ජාතීන්ගේ ලංකා ගමනය (ලංකාවට පැමිණීම) නිසා අපට ඇති වූ යහපත් ප්‍රතිඵල තුනක් හා අයහපත් ප්‍රතිඵල 3ක් ලියන්න. (ලකුණු 06යි)

(09) I. "පුනරුදය" නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

II. පුනරුද යුගයේ පහත ක්ෂේත්‍ර සම්බන්ධව වැදගත් පුද්ගලයන් දී ඇති වරහන තුළින් තෝරා ලියන්න.
a. දක්ෂ චිත්‍ර හා මූර්ති ශිල්පියෙක් ලෙස සලකයි -
b. තාරකා විද්‍යාවේ පියා ලෙස සලකයි -
c. අත්හදා බැලීමේ පියා ලෙස සලකයි -
d. ගත් කුවරයෙක් ලෙස සලකයි -
(ලියනාඩෝ ඩාවින්චි, මයිකල් සර්වෙටස්, නිකලස් කොපර්නිකස්, ගැලිලියෝ ගැලීලි, පෙට්‍රාක්, නිව්ටන්) (ලකුණු 04යි)

III. පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. ඉන් එකක් පුනරුදය ඇති වීමට හේතු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. පුනරුදයේ ප්‍රතිඵල තුනක් ලියා ඉන් එකක් සරලව පහදන්න. (ලකුණු 06යි)

# වර්ෂ අවසාන පරීක්ෂණය - 2018
## ඉතිහාසය - 10 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 1 | 21. | 4 | 31. | 4 |
| 2. | 3 | 12. | 1 | 22. | 4 | 32. | 1 |
| 3. | 1 | 13. | 3 | 23. | 3 | 33. | 3 |
| 4. | 4 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 5. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 1 |
| 6. | 2 | 16. | 2 | 26. | 1 | 36. | 2 |
| 7. | 3 | 17. | 3 | 27. | 3 | 37. | 1 |
| 8. | 4 | 18. | 2 | 28. | 1 | 38. | 4 |
| 9. | 3 | 19. | 3 | 29. | 3 | 39. | 2 |
| 10. | 2 | 20. | 2 | 30. | 1 | 40. | 3 |

### II පත්‍රය

01. (1) ලංකා සිතියම
(2) ලෝක සිතියම

02. (i) A- පණ්ඩුකාභය  B- ජ්ලීනි  C- වස්කෝද ගාමා  D- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ලකුණු 04)

(ii) P- II රාජසිංහ රජතුමා  R- 1638 - ගන්නෝරු සටන
Q- මහනුවර  S- බ්‍රිතාන්‍ය ජාතික රොබට් නොක්ස් (ලකුණු 04)

(iii) i යකඩ නිස්සාරණ උඳුන
ii යපස් වලින් යකඩ වෙන්කර ගැනීම/නිස්සාරණය
iii සබරගමු පළාතේ - සමනල වැව
iv දහනය සඳහා සිදුරු විද තිබීම හා දහනයට ඔක්සිජන් වායුව අවශ්‍ය බව දැන සිටීම
සුළං මුහුණතට විවෘත වන ලෙස උඳුන් නිපදවීම (ලකුණු 04)

**II කොටස**

02. (i) a- දීප වංශය  b- නිකාය සංග්‍රහය  c- මහා වංශය (ලකුණු 03)

(ii) i කාලය හා අවකාශය පිළිබඳ දැන ගැනීමට
ii අතීත අත්දැකීම් මඟින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩ නැගීමට
iii අන් සංස්කෘතීන්ට ගරු කිරීමට
iv විවිධ මත ඉවසීමට..... ආදී කරුණු සඳහා (ලකුණු 04)

(iii) (a) "නානක මූලාශ්‍ර යනු කාසි විද්‍යාවයි/ කාසි පිළිබඳ හැදෑරීමයි
(b) ● ඒ ඒ කාල වල පැවති ලෝහ වර්ග පිළිබඳව දැන ගැනීමට
● දේශීය හා විදේශීය වෙළඳ තොරතුරු ලබා ගැනීමට
● භාවිතා කළ තාක්ෂණය පිළිබඳ දැනගැනීමට
● රට තුළ පැවති ආර්ථික තත්ත්වය පිළිබඳ අවබෝධ කර ගැනීමට
● ඒ ඒ කාල වල රජ කළ රජවරුන් පිළිබඳ දැන ගැනීමට ආදී කරුණු සඳහා.... (ලකුණු 05)

(iv) i පාසල තුළ පුරාවිද්‍යා සංගම් බිහි කිරීම තුළින්
ii පාසල් ප්‍රජාවට විවිධ වැඩසටහන් ඔස්සේ එහි වැදගත්තම පිළිබඳ දැනුවත් කිරීමට
iii පෝස්ටර් මඟින්/ නාට්‍ය මඟින්/ පුවත් පත් වල ලිපි ලිවීම මඟින්/ පුරාවස්තු රැක ගැනීම පිළිබඳ දැනුවත් කිරීම
iv පුරාවස්තු වලට හානි වල අවස්ථා පිළිබඳව දැන ගතහොත් බලධාරීන්ට ඒ පිළිබඳව දැනුම් දීම
v පුරාවස්තු සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලවල් හඳුන්වා දීම (ලකුණු 06)

03. (i) පාහියන්ගල, බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන, සීගිරි පොතාන, අලිගල (ලකුණු 03)

(ii) ● වාර්ෂික වර්ෂාපතනය/ ජල පහසුව  ● ආහාර සුලභතාව
● පාෂාණ වර්ග වල සුලභතාව  ● ආරක්ෂාව (ලකුණු 04)

(iii) ● උඩරංචාමඩම නිවස  ● ලම්භක න්‍යායය
● ලෝහ තාක්ෂණය  ● මැටි පබළු තාක්ෂණය
● මැටි වලං තාක්ෂණය  ● ඇඹරුම් ගල් නිෂ්පාදනය කර තිබීම (ලකුණු 05)

(iv) ★ වැව කේන්ද්‍ර කර ගනිමින් ජනාවාස බිහිවී තිබීම උදා:- සුමන වාපි, විහාර වාපි, හුන්දර වාපි
★ පරික්ෂිත ගම් සහ අපරික්ෂිත ගම් පැවතීම
★ විවිධ වෘත්තිකයන්ට අනුව ගම් වෙන් වෙන් ව පැවතීම උදා:- පට්යන ගාම, කුම්භකාර ගාම, ගෝපාල ගාම
★ ජනාවාස වල ස්වභාවය අනුව නගර හා ගම් ලෙස බෙදීම
★ ගමික, පරුමුඛ, පරුමුඛලු යන තනතුරු ඔස්සේ ඒවා පාලනය කිරීම ආදිය (ලකුණු 06)

04. (1) i කාශ්‍යප රජතුමා ii කුටකණ්ණාභය රජතුමා iii නිශ්ශංක මල්ල රජු (ලකුණු 03)
(2) • නගර ආරක්ෂකයා • භාණ්ඩාගාරික
• ඇත් අංශයේ ප්‍රධාන • කාසි අච්චු ගැසීමේ නිලධාරී (ලකුණු 04)
(3) • පියාගෙන් පුතාට රාජ්‍යය හිමි වීම • සහෝදරයාගෙන් සහෝදරයාට රාජ්‍ය උරුමය හිමිවීම.
• රජුගේ බිරිඳගේ සොහොයුරාට හෝ රජුගේ සහෝදරියගේ පුතාට හිමිවීම.
(උදාහරණ මඟින් පිළිතුර තහවුරු කර තිබිය යුතුය) (ලකුණු 05)
(4) **දේශපාලන**
• ලම්භකර්ණ වංශයේ ආරම්භක පාලකයා වීම
• රට අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම
• ලංකාවේ සියලු ප්‍රදේශ රජුගේ පාලනයට නතු කර ගැනීම උදා:- **පනාකඩුව තඹ සන්නස මඟින් මේ බව පැහැදිලි වේ.**
බලය විමධ්‍යගත කර තිබීම උදා:- **සෘෂිගිරි ඇමති යාපනය ප්‍රදේශය භාරව සිටීම**

**ආර්ථික**
• ප්‍රථම වරට අයබදු අය කිරීම විධිමත් කළ රජු වීම
• විශාල ප්‍රමාණයේ වැව් ඉදි කළ රජු වීම
• නව ජලාශ ඉදි කිරීමට රජයේ මුදල් වැය කළ යුතු බව ප්‍රකාශ කිරීම හා එය ක්‍රියාත්මක කිරීම
• ක්‍රිෂ්ණ නදී නිම්නයේ ඇතිවූ ආහාර හිඟයට පිළියම් යෙදීම සඳහා කෘෂි අංශය දියුණු කිරීමට පෙළඹීම
(ලකුණු 06)

05. (1) A - II අග්ගබෝධි රජු B - ධාතුසේන රජු C - දේවානම්පියතිස්ස රජු (ලකුණු 03)
(2) • කාලිංග මාඝ ආක්‍රමණය • දුර්වල පාලකයන් බලයට පත් වීම
• කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර ගැටුම් ඇති වීම
• රජරට ආර්ථික පරිහානිය හා ඉහත හේතු මත මධ්‍යග පාලනය බිඳ වැටීම, ආරක්ෂාව නැතිවීම, වෙළඳාම හා ප්‍රවාහණය අඩපණ වීම, ප්‍රභූන් හා උරුමකරුවන් වෙනත් ප්‍රදේශ වලට සංක්‍රමණය වීම ආදිය නිසා රජරට ශිෂ්ටාචාරය පරිහානියට පත් වූ බව (ලකුණු 04)
(3) • iv වන මිහිඳු රජුගේ - අනුරාධපුර පුවරු ලිපියේ සඳහන් කරුණු (උස් බිම් ඉඩම් වල කැලෑ නොකැපිය යුතු බව)
• iii උදය රජු - බුද්ධන්නේහෙල සෙල්ලිපිය (ගොවිතැන් කළ යුතු බෝග)
• v වන කාශ්‍යප රජු - කෝණ්ඩවට්ටවාන් ටැම් ලිපිය ( වල්වල දඬුපත් නොකපනු ඉසා)
• අමණ්ඩගාමිණී අභය රජු - "මාඝාත නීතිය"
• නිශ්ශංක මල්ල රජු - මිහින්තලා පුවරු ලිපිය ( ජලාශ වල හා අවට ජීවත් වන සතුන් නොමැරිය යුතු බව
(ලකුණු 05)
(4) A- කුළු වැව B- කළිඟු බැම්ම C- බිසෝ කොටුව D- පිටවාන
(මින් දෙකක කාර්ය විස්තර කර තිබීම අවශ්‍ය වේ) (ලකුණු 06)

06. (1) a- ගෘහපති b- ගමික c- පරුමුඛ (ලකුණු 03)
(2) • කෘෂි කර්මාන්තය නගා සිටුවීමට
• වාරි පද්ධතිය සංවර්ධනය කිරීමට
• දේශීය හා විදේශීය ආක්‍රමණ වලින් මහජනයා ආරක්ෂා කිරීම
• බුදු දහමට අනුග්‍රහ දැක්වීමට
• ජනතාවගේ සමාජ සුභසාධන කටයුතු වලට සහය දීමට
• නීතිරීති පැනවීම මඟින් ද මහජන හිතකාමී පාලනයක් ගෙන යාමට කටයුතු කිරීමට
• සමාජ සංස්කෘතික අභිවර්ධනයට සහය දැක්වීමට ආදී කරුණු සඳහා (ලකුණු 04)
(3) ගොඩ ගොවිතැන හා මඩ ගොවිතැන පිළිබඳ විස්තර කර තිබීම ආදී... (ලකුණු 05)
(4) (1) හෝපිටිගමුව ටැම් ලිපියේ සඳහන් වෙළඳ නීති පිළිබඳ විස්තර කර තිබීම
උදා:- • බුලත් විකිණීමේ දී හිරු එළියෙන් ආවරණය විය යුතු බව
• කිරුම් මිනුම් ප්‍රමිති ගත විය යුතු බව
• බදු අය කිරීම - වෙළඳ පලට එන අය හෝ පමණක් කළ යුතු බව
• පොහොය දින වල වෙළඳාම් කිරීම තහනම් කළ යුතු බව (ලකුණු 06)

07. (1) (i) කෝට්ටේ (ii) උඩරට (iii) යාපනය (ලකුණු 03)
(2) • ක්‍රි.ව. 1594 - පේරෝ ලෝපේස් ද සූසා
• ක්‍රි.ව. 1602 - දොන්ජොරනිමෝද අසවේදු
• ක්‍රි.ව. 1630 - කොන්ස්තන්තීනූ ද සා
• ක්‍රි.ව. 1638 - දියෝ ගෝද මෙලෝ (ලකුණු 04)
(3) • උඩරට රාජ්‍යය උරුමය තහවුරු කර ගැනීම
• දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුන් වහන්සේ මහනුවරට වැඩම කරවීම
• උඩරට රාජ්‍යය පෘතුගීසින්ගෙන් බේරා ගැනීමට කටයුතු කිරීම
උදා:- දන්තුරේ සටන හා පෘතුගීසින්ට එරෙහිව පහතරටින් එල්ලවූ කැරළි වලට සහය දීම
• බුදු දහමට අනුග්‍රහය දැක්වීම ( බෞද්ධ නමක් යොදා ගැනීම/උපසම්පදාව බුරුමයෙන් ගෙන් වීම)
• ගොවිතැන් දියුණු කිරීම / යකඩ කර්මාන්තය හා වෙඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම. (ලකුණු 05)

(4) <u>ආර්ථික කටයුතු</u>

- කෘෂි ආර්ථිකය ප්‍රධාන වීම හා ස්වයංපෝෂිත එකක් වීම
- වී වගාව අඩු වීම
- හේන් වගාව වැඩිපුර සිදු වීම (ධාන්‍ය/අලවර්ග/කුළු බඩු)
- යකඩ, දැව, ලෝහ හා ලාක්ෂා කර්මාන්ත දියුණු වීම
- සත්ත්ව පාලනය පැවතීම
- සියළු ඉඩම් වල අයිතිය රජු සතු වීම

<u>සමාජ කටයුතු</u>

- සියළු කටයුතු රජුගේ අධිකාරිත්වය යටතේ සිදු වීම
- ඉඩම් භුක්ති ක්‍රමය යටතේ පදනම් වූ ගම් පැවතීම උදා:- දේවාල ගම්, නින්ද ගම්, පරවේණි
- කුල ක්‍රමයක් පැවතීම
- පන්සල මුල් වූ සමාජ ක්‍රමය
- උඩරට රාජ්‍යයේ ඊට ආවේණික වූ සංස්කෘතික ලක්ෂණ පැවතීම
- ග්‍රාමීය සමාජයක් පැවතීම (ලකුණු 06)

08. (1) i ගෝව ii බතාවිය iii මධුරාසිය (ලකුණු 03)

(2)
- කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන්ට යටත් වීම නිසා වෙළඳ මාර්ග ඇහිරීම එම නිසා යුරෝපීන්ට ආසියාවට පැමිණීමේ අභියෝගයට මුහුණ දීමට සිදු වීම
- දේශගවේශණය කිරීම
- අධිරාජ්‍යවාදය ව්‍යාප්ත කිරීම
- ආගම ප්‍රචාරය
- වෙළඳාම සඳහා ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කිරීම (ලකුණු 04)

(3)
- හෙන්රි රජුගේ දායකත්වය හා ඉසබෙලා රැජිණ විසින් ලබා දුන් රාජ්‍ය අනුග්‍රහය
- රටවල් අතර අධිරාජ්‍ය සඳහා ඇති වූ තරගය
- මාලිමා යන්ත්‍රය සොයා ගැනීම
- ගැලීලියෝ ගැලීලි දුරදක්නය සොයා ගැනීම
- ලෝක සිතියම නිර්මාණය - ටොලමි
- දේශ ගවේෂණයට පෙළඹුණු යුරෝපීය ජාතීන්ගේ නව සොයා ගැනීම් හා ඒවා ඔස්සේ තව දුරටත් සිදුවූ බලපෑම

උදා:- වස්කෝද ගාමා, බර්තලමියු ඩයස්, මැගලන්, කොලොම්බස් යන අයගේ සොයා ගැනීම් (ලකුණු 05)

(4)

| යහපත් | අයහපත් |
| --- | --- |
| • වාණිජ ආර්ථිකයක් ඇතිවීම | • බටහිර සංස්කෘතිය සම්මිශ්‍රණය වීම |
| • ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ලැබීම | • යටත් විජිතයක් බවට පත් වීම |
| • නීති පද්ධතියක් ගොඩ නැගීම | • විදේශ ආක්‍රමණ වලට ලක් වීම |
| • ඉංග්‍රිසි අධ්‍යාපනය ලැබීම | • වස්තුව හා දේපල කොල්ල කෑම ආදී... |
| • යටිතල පහසුකම් සංවර්ධනය වීම | |

(ලකුණු 06)


09. (1) ග්‍රීක රෝම ශිෂ්ඨාචාරවලට නව පනක් ලැබීම
යුරෝපයේ දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා ආගමික යන ක්ෂේත්‍ර වල ඇති වූ පිබිදීම
(ලකුණු 03)

(2) (a) මයිකල් ආන්ජලෝ
(b) නිකලස් කොපර්නිකස්
(c) ගැලීලියෝ ගැලිලි
(d) පෙට්ට්‍රාක් (ලකුණු 04)


(3)
- කොන්ස්තන්තිනෝපලය තුර්කීන්ට යටත් වීම
- වෙළඳාමේ දියුණුව
- බුද්ධි ප්‍රබෝධය
- පල්ලි ආධිපත්‍ය විවේචනයට ලක් වීම
- සාගත වසංගත රෝග ඇති වීම ආදී.... (ලකුණු 05)

(4)
- ආගමික ප්‍රතිසංස්කරණ ඇති වීම
- දේශගවේෂණය
- යටත් විජිත බිහි වීම
- ශ්‍රාස්ත්‍රීය පුනරුදය
- මානව වාදය ඉස්මතු වීම
- විද්‍යාවේ දියුණුව (සොයා ගැනීම්
- ගෘහ නිර්මාණ ශිල්පය, කලාව හා චිත්‍ර යන අංශයන්ගේ ඇති වූ දියුණුව (ලකුණු 06)

01.(1)


N
පළාත් මායිම
ඉරණමඩු
මන්නාරම
ත්‍රිකුණාමලය
කලා ඔය
පරාක්‍රම සමුද්‍රය
ගල් සොහොන් කනත්ත
පිදුරුතලාගල
සංකඩගල
කෝට්ටේ
මාගම

(2)


N
ඉතාලිය
ජපානය
රතු මුහුද
කල්කටා
පෝක් සමුද්‍ර සංධිය
සුමාත්‍රා